**රබර් පාලන අරමුදල - 2015**

---

රබර් පාලන අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1957 අංක 45 දරන රබර් පාලන (සංශෝධිත) පනත මඟින් සංශෝධිත 1956 අංක 11 දරන රබර් පාලන පනතේ (436 අධිකාරය) 39 (අ) (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස ශේෂ පත්‍රයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 මතය ව්‍යාචනය**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතු කොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---

අරමුදල සතුව තිබූ ස්ථාවර තැන්පතු හා ආයෝජන රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරා තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු මෙහෙයුම් කටයුත්තක් සිදු නොකිරීම හා වෙනත් ආදායමක් උපයා නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ආදායම් වියදම් ප්‍රකාශනයක් හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් ඉදිරිපත් කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

ඒකාබද්ධ අරමුදලට බැර කළ රු. 1,864,559 ක් රබර් පාලන අරමුදලෙන් අඩු කර දක්වනවා වෙනුවට එය ජංගම වත්කමක් ලෙස දක්වා තිබුණි.

**2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂ**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එකතුව රු. 635,271 ක් වූ ජංගම වත්කම් 13 ක ශේෂ වර්ෂ 18 කට වැඩි කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල නොවෙනස්ව ඉදිරියට ගෙන එමින් පැවති අතර එම ශේෂයන් තුළ රු.287,378 ක නොපියවූ අත්තිකාරම් ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) එකතුව රු. 239,784 ක ජංගම බැරකම් විෂයයන් 05 ක ශේෂ වර්ෂ 18 ට වැඩි කාලයක් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනවිත් තිබූ අතර, ඊට ඇතුළත් රු.222,031 ක ගෙවිය යුතු අත්තිකාරම් නිරවුල් කිරීමටද පියවර ගෙන නොතිබුණි.

**2.2.4 විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි නොවීම**

පහත සඳහන් විෂයයන් සනාථ කර ගැනීමට අදාළ කර ගත හැකි කිසිඳු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීට හෝ නොහැකි විය.

| | **විෂයය** | **වටිනාකම** | **ඉදිරිපත් නොවූ සාක්ෂි** |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ස්ථාවර වත්කම් | 985,925 | උපලේඛණ, භාණ්ඩ සමීක්ෂණ වාර්තා, ස්ථාවර වත්කම් ලේඛණ |
| (ආ) | ජංගම වත්කම් | 635,271 | උපලේඛණ, වයස් විශ්ලේෂණ, ශේෂ සනාථන හා පොත්පත් |
| (ඇ) | ජංගම බැරකම් | 239,784 | උපලේඛණ, වයස් විශ්ලේෂණ, ශේෂ සනාථන හා පොත්පත් ලේඛණ |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

2013 දෙසැම්බර් 31 දිනට අරමුදලට අයත් ස්ථාවර හා ඉතිරිකිරීමේ තැන්පතු සඳහා ලැබී තිබුණු පොළී ආදායම අරමුදලේ එකම ආදායම් ප්‍රභවය වී තිබුණි. ඉකුත් වර්ෂය අවසානයට රු.10,456,639 ක ස්ථාවර තැන්පතු 02 සහ රු.3,435,797 ක ඉතිරි කිරීමේ තැන්පතුවට ලැබියයුතු පොළී රු. 12,957 ක් ඇවර කිරීමේ ගිණුමකට හර කර තිබුණි. ඒ අනුව 2015 ජනවාරි 01 දිනට ඇවර කිරීමේ ගිණුමේ වූ රු.13,905,393 ක හර ශේෂය සමාලෝචිත වර්ෂයේදී රබර් පාලන ගිණුමට හර කිරීම නිසා එම ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි. තවදුරටත් අරමුදලේ මෙහෙයුම් ක්‍රියාකාරිත්වයක් නොමැති බැවින් සමාලෝචිත වර්ෂයට ආදායම් වියදම් ගිණුම හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි.

**3.2 මෙහෙයුම් සමාලෝචනය**

**3.2.1 අරමුදලේ ක්‍රියාකාරකම් පිළිබඳ වර්තමාන තත්ත්වය**

2009 ජූලි 23 දින පැවති රාජ්‍ය ගිණුම්කාරක සභාවේදී අරමුදල ඇවර කිරීමට නියෝග කර ඇතත් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර තිබුණේ 2016 පෙබරවාරි 26 දිනදීය. 2016 මාර්තු 17 දින පැවති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ඇවරකරුවකු පත්කර තිබුණි. මුදල් අමාත්‍යාංශයේ නිරීක්ෂණවලට අනුකූලව අරමුදලේ කටයුතු ඇවර කිරීමට අවශ්‍ය ව්‍යවස්ථා කෙටුම්පත් නීති කෙටුම්පත් සම්පාදක සම්බන්ධ කරගෙන පිළියෙල කර නොතිබුණි.

**3.3 අයවැය ලේඛනමය පාලනය**

අරමුදලේ ක්‍රියාකාරිත්වයක් සිදු නොවන බැවින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

**4. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. ස්ථාවර වත්කම් හා ලැබිය යුතු / ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.